# සතුටින්ය දැන් මං

මගේ ලොව අද හිරු නැත
දිදුළන තරු පමණක්ම ඇත
මා දිවිය ජය ගෙන ඇත
සිතට මගෙ සැනසුම ඇත
සතුටින්ය දැන් මම

සය මසක් මුහුදින් එතෙර
සය මසක් මුහුදින් මෙතෙර
ගමන් මළු පුරාගෙන
නෑ සියන්හට බෙදමින
සතුටින්ය දැන් මම

මුණුපුරන් ඇසුරෙහි මම
දඟයන්ගෙ සුරතල් දකිමින
සිඟිත්තන්ගෙ ලොවේ හිඳිමින
සිටිමි පාළුව මකා ගනිමින
සතුටින්ය දැන් මම

ඉංගිරිසි බස හසුරුවන
මගෙ පොඩි මුණුපුරන්හට
පන්සිල් ගන්නා අයුරු
සිංහල උගන්වමි
සතුටින්ය දැන් මම

ලොකු මුණුපුරාගෙන් මම
සීයාගේ හැඩ රුව දකින්නෙමි
ට්‍රෑම් කාර් දුවන වීදිය දිගේ
අල්ලමින් චූටි අත්
රැගෙන යමි පාසැලට
සතුටින්ය දැන් මම

ඇමරිකාවෙහි වසන
එකම මිණිපිරිය මගෙ
වැරදියට බස දොඩන
නම ඇමන්ඩා මිටීකාය
ඇය අමන්දාවකි මට
සතුටින්ය දැන් මම

ශීත හිම වැටෙන කල
උණුසුම් පොරවනය තුළ
ගැහි ගැහී ගුලි ගැසී උන්නත්
දරු මුණුපුරන් සමඟය මම
සතුටින්ය දැන් මම

කොයි රටේ සිටියත් මම
හදා දෙමි බත් සහ මාළු පිනි
අපේ තුනපහ අපේ රසයට
සෙනෙහසින් දරුවන්හට කවන්නෙමි
සිගරට් උර උරා වයින් බොන
හම සුදු අත්තම්මලාට වඩා
සතුටින්ය දැන් මම

වසරකට එක් වරක්
පොඩි සුරතලුන් සමඟින්
ගත කරන්නට මා හට
යන්නට දස දහස් දුර
සවිය සහ දිරිය මට
ලබා දෙනු දෙවියනි මට
සතුටින්ය එතකොට මම

**මල්ලිකා ගලගෙදර**



මුළු ලොවට රහසේම
හදවත එකලු කල
පුංචි තරු කැකුළ නුඹ
මගේ සිත අග පිපුණා...
නිසංසක රෑ යමක
පන්හිඳට පණ පොවන
සොඳුරු සිතුවිල්ල නුඹ
කවියකට ඉඟි කරන...
ජීවිතේ වාලුකා කතර මැද
හමුවෙච්ච සිහිල් දිය බිඳුව
නුඹ හදවතට සුව ගෙනෙන...
ගෙවෙන හැම මොහොතකම
මතකයේ නිදන් උන
එකම එක පැතුම නුඹ
නෙතඟ කඳුළැලි පිසින...

**චරිඳු සිල්වා**



# නන්නාඳුනන්නෙකුගේ කවිය

නොහඬන්න මගේ සොහොන මත සිට
මා එතැන නැත. නොනිදමි මම
හමන දහස් සුළං රැළි වෙමි මම
හිම මත දිදුලන දියමන්ති වෙමි මම
අස්වනු මෝරන හිරු රැස් වෙමි මම

සිසිරයේ පොද වැස්ස වෙමි මම
නිසල හිමිදිරියේ ඔබ අවදි වන විට
නිහඬ සියොතුන් රෑන් රෑන්
ගුවනට ඔසවන පවන් පොද මම
රෑ කල දිදුලන සුමුදු තරු පොකුරු මම
නොහඬන්න මගේ සොහොන මත සිට
මා එතැන නැත. නොමළෙමි මම

(පනස් වසරකට පමණ පෙර ලියැවී
ඇති මෙම කවිය කාගේදැයි නොදනී.)

**ශ්‍රියා කුමාරසිංහ**

පරිවර්තනයකි.



# සමුගැනීම

නිශාවේ මිදුණු පිණි
මුදාලයි මඳින් මඳ
රැයේ බැඳි කැටි

නගරයේ සිව් දෙසින් නැගුණු
හැම පව්වකම හඬ ඇසෙයි
නවතින්න එය කියයි
නුඹෙ මග වලක්වයි
හිස හොවා බලා හුන් වළාකුළු වල සිරස්
ඇතුළතින් කැළඹිලා සැරිසරයි හැම තැනම

රෝස පෙති මත රැඳුණු
කඳුළු බිඳු පිසින්නට
දිග ඇදෙන සූර්ය අත් ඉක්මවා
දිය බිංදු ඇද වැටෙයි
මහ පොළව තෙත බරයි

**සී.සිවසේකරම්**

පරිවර්තනය

**නිලාර් එන්. කාසිම්**

# අපභ්‍රංශ

නාස් පුඩු සසලවා සියොළඟ දවාහල දා බිඳු නැගී
ඉවෙන් මෙන් මා සිඹිමි එනමුත් අනේ සුවඳක් ලඟ නැතී
කියත් නොතෙපුල් දොඩත් ඉඳුවර ලබත් සුවිසි මන බැඳී
හදත් ගොළුවූ සඳත් ලඟ නැති නැතත් කවුරුත් සිත් වැදී

වළා පිරිමැද බලා නැකතක් සුභ අසුභ විමසා තියා
පටන් ගත් වැඩ එතනමයි ඇයි මියැදුනේ සිනිවිලි මකා
ගියා නාවත් කමක් නෑ දැන් හිතත් දෙනෙතත් ගොළු වෙලා
සිනා නොදැනෙන විකල් මනසින් සිටිමි කල කරුමය නිසා

බෝදිනී රත්මැණික්




# WANT TO GET PR...?

ඕස්ට්‍රේලියාවේ දී
ONSHORE
STUDENT - PR
Have you completed or about to complete your Degree/Diploma?

ශ්‍රී ලංකාවේ දී
OFFSHORE
SKILLED MIGRATION
- A Trade Certificate/ Diploma/ Degree or Professional Qualification?
- Have 1/3/4/6/7 year(s) experience in a skilled occupation or business?

OTHER MIGRATION
*Business Owners & Investors/ Visitors/ Spouse/ Parents/ and all other categories*
Free Service for Student Migration
IF YOU HAVE BLOOD RELATIVES IN AUSTRALIA IT IS AN ADVANTAGE
YOU SHOULD BE BELOW 45 YEARS
Good Knowledge of English
**PROFESSIONAL ADVICE TOWARDS POSITIVE RESULTS**

Contact
Hirosh Hemantha Gamage ASA, AAIBF (Snr), MMIA
(Registered Migration Agent No: 0320696)

**Multinational Migration Services**
20/215, Betula Avenue, Mill Park
Vic 3082, Australia
Tel: 03 97377384/ 0421155152
Fax: 03 94372803

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

**AUSTRALIAN MIGRATION SERVICES**
245 (3rd Floor), Dharmapala Mw ,
Colombo 07
Tel: +94 11 5500 100 / 94 773770202
Fax: +94 11 2697 243

E-mail: info@multinational.com.au

For More details or FREE Online Assessment Visit Our Web Site
www.multinational.com.au

Sannasa